**225 - ශ්‍රී ලංකා පොලීසිය**
**-----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පොලීසියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩණ වාර්තාව 2020 ජුනි 12 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝම්බර් 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කලට සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- ශ්‍රී ලංකා පොලීසියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්මය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්මේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ වර්ෂ අවසාන වටිනාකම ACA - 6 ආකෘතිය අනුව රු.25,386,230,978 වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර වත්කම් වාර්තාව අනුව එම වටිනාකම රු.20,735,157,569 ක් වූයෙන් රු.4,651,073,409 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස්කම් සඳහා අදාල කරුණු අනාවරණය කර ගත යුතු අතර කඩිනමින් නිවැරදි කළ යුතුය. | සියළු වත්කම් සිගාස් වැඩසටහනට ඇතුලත් කිරීම කඩිනමින් සිදු කරනු ලැබේ. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ ලේඛනයට අනුව බැරකම් වටිනාකම රු.1,502,298,747 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන සටහන (iii) ට අනුව බැරකම් වටිනාකම රු.1,470,923,575 ක් වූයෙන් රු.31,375,172 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස්කම් සඳහා අදාල කරුණු අනාවරණය කර නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කල යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශනයේ සටහන II යටතේ වූ ආරම්භක ශේෂය සටහන් කිරීමේදී අලාභ අයිතම 32 කට අදාලව රු.14,645,410 ක් වැඩියෙන් ද අලාභ අයිතම දෙකක රු.234,593 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. එමෙන්ම වර්ෂය අවසානයේ කපා නොහල අවසන් ශේෂය රු.9,151,618 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අලාභ අයිතමයන්ට අදාල නිවැරදි වටිනාකම් ඇතුලත්කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

### 1.6.2 පොදු තැන්පතු

සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පත් ගිණුම් ශේෂ වටිනාකම රු. 246,891,352 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු. 11,503,192 ක මුදලින් අදාල කාර්යයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රදවාගෙන තිබුණි. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන උපයෝජනය කල යුතුය. | ප්‍රතිපාදන උපයෝජනය කර ගැනීමට කටයුතු කරමින් පවතියි. |
| (ආ) අවිධිමත් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම හේතුවෙන් නවතන ලද ව්‍යාපෘති 67 කට අදාලව පවතින බේරුම් ක්‍රියාවලිය මෙතෙක් අවසන් නොවීම නිසා නිරවුල් කිරීමට නොහැකිව තිබූ වර්ෂ 5 ත් 7 ත් අතර වූ ගොඩනැගිලි කොට්ඨාශය යටතේ වූ තැන්පතු වටිනාකම රු. 202,223,782 ක් විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ගැටළු කඩිනමින් විසඳා කල් ඉකුත් වූ තැන්පතු නිරවුල් කල යුතුය. | බේරුම් ක්‍රියාවලිය මෙතෙක් අවසන් වී නැත. |

### 1.6.3 ගණන් දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතික වීම

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායි තාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇති අතර ඒ සම්බන්ධව උප ගිණුම් ඒකකයන්හි සිදුකරන අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා මගින් හෙලිවන කරුණු පදනම්කර ගනිමින් අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| යාමට අවශ්‍ය වෙනස් කම් සිදුකරනු ලැබිය යුතු බවත් එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ආ) රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ගිණුම් ක්‍රමයක් හා අභ්‍යන්තර පාලන ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා ණය හා අත්තිකාරම් ලේඛන, ණය හා ණයගැති අත්තිකාරම් ලේඛනය, ණය හා ණයහිමි ලේඛනය යනාදිය නිසි පරිදි ලියා ගොනු කල යුතු බව හා මාස්පතා දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පොත් සමඟ සැසදූ බවට සහතික කර සැසඳුම් ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් කර තිබුණද එසේ සහතික කර ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

**1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම්වලට අදාලව දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු. 954,557,613 ක් වුවද, භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.955,341,942 ක් වූයෙන් රු.784,329 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂයන්ගේ වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේදී තොරතුරු පරීක්ෂාකර තහවුරු කර ගැනීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු පොත් නිරවුල් කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම අනුව 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.954,557,613 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.873,216,435 ක් විය. ඒ අනුව රු.81,341,178 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | මෙම වෙනස වාර්ෂිකව අඩු කිරීමට කටයුතු කර ඇත. ණය ශේෂ සටහන් කිරීමේ දෝෂ, අත්හැරීම් දෝෂ සිදුවී ඇති අතර වර්ෂ ගණනාවක සිටවූ වෙනස එක්වර අවසන් කිරීම ප්‍රායෝගිකව අපහසු වී ඇත. |
| (ඇ) විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිටි තිබුණු නිළධාරීන් 3,533 කින් අයවිය යුතු ශේෂ වල එකතුව රු. 79,733,034 ක් වූ අතර ඒ අතරින් වර්ෂ 03ට වැඩි හිඟ හිටි ණය ශේෂවල එකතුව රු. 57,201,540 ක් වී තිබුණි. | හිඟ හිටි ශේෂයන් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීම සඳහා ණය අයකර ගැනීමේ ප්‍රධාන ඒකකය සම්බන්ධීකරණය කර කොට්ඨශ මට්ටමින් ණය අයකර ගැනීමේ කමිටු පිහිටා ණය මුදල් වාරික වශයෙන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 වියදම් කළමනාකරණය

--------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබූ රු. 1,091,000,000 ක මුළු මූලධන වියදම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.300,709,393 ක් ඉතිරිවී තිබුණි. එම ඉතිරිවීම් සියයට 24 සිට සියයට 42 දක්වා පරාසයන් ගෙන තිබුණි. | ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂ මතාවයකින් යුතුව උපයෝජනය කළ යුතුය. | අක්මුදල් නොලැබීම මෙන්ම අයහපත් කාලගුණය, තාක්ෂණික දෝෂ, ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකිවීම වැනි කරුණු මේ සඳහා බලපා තිබුණි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ 25(1) හා 25 (4) වගන්ති අනුව අභ්‍යාස ආයතනයේ නිසි පරිදි ගිණුම් පොත් තැබීමට සහ සියලු ආදායම් සහ වියදම් පිළිබඳව ද, වත්කම් හා බැරකම් පිළිබඳව ද, වෙනත් සියළු මූල්‍ය ගණුදෙනු පිළිබඳවද ගිණුම් තැබීමට සහ අභ්‍යාස ආයතනයේ වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම ගණකාධිකාරිවරයා විසින් සිදුකලයුතු බව දැක්වුණද, එසේ සිදුව නොතිබුණි. | ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ වගන්ති ප්‍රකාර කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) පොලිස් අභ්‍යාස ආයතන පනතේ V කොටසේ ඇතුලත් 'මුදල්' සම්බන්ධ කටයුතුවලට අදාල "ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුදල" පිහිටුවීම හා පනතේ ඊට අදාල 22 සිට 28 දක්වා වූ කාර්යයන් හා කර්තව්‍යයන් සිදුව නොතිබුණි. | "අරමුදල" පිහිටුවා අදාල නියමයන් ප්‍රකාර කටයුතු කළ යුතුය. | පාඨමාලා සඳහා ගාස්තු අයනොකරන බැවින් අරමුදල පිහිටුවා නැත. |

**3.2** **අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. ඒ අනුව සංශෝධන සිදුකල යුතු ක්ෂේත්‍ර 16 ක් ද හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන | හඳුනාගත් ක්ෂේත්‍රයන්ට අදාලව පනත සංශෝධනය කළ යුතුය. | මහජන අදහස් හා යෝජනා විමසීමක් සිදුකර ඇති අතර ඉන් අනතුරුව කිසිඳු ක්‍රියාමාර්ගයක් සිදුව නැත. 2020 මැයි මස පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය පොලිස්පති වෙතින් වාර්තාවක් කැඳවා ඇත. |

| | | | |
|---|---|---|---|
| | දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද 2020 ජූනි මාසය වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීමට 2015 වර්ෂයේදී හඳුනාගෙන තිබූ අතර යෝජිත විශ්වවිද්‍යාලය සඳහා අත්තිඩිය ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තෝරාගෙන තිබුණි. බ්‍රිතාන්‍ය නෝට්න්හැම්, ලිවර්පූල් මෙන්ම ඕස්ට්‍රේලියානු ඩීකින් විශ්වවිද්‍යාලයන්හි සහාය මේ සඳහා ලබා ගැනීමටත් සැලසුම්කර තිබුණ ද විශ්වවිද්‍යාලය පිහිටුවීමට අවශ්‍ය පනත සම්මත කර ගැනීම 2020 ජූනි මස වන විටත් සිදුකර නොතිබුණි. | විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාල නීති කටයුතු කඩිනමින් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. | විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා අක්‍රීයව පැවති ක්‍රියාකාරී කමිටුව නැවත ස්ථාපනය කිරීමටත්, සංකල්ප පත්‍රිකාව නැවත සකස් කිරීමටත් 2020 ජූලි මස යෝජනා වී ඇති අතර ඊට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| (ඇ) | ශ්‍රී ලංකා පොලීසියේ තත්කාලීනව පවත්නා අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන නිසි පරිදි යාවත්කාලීන කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමටත් අනාගතයේ යහපත් සහ කාර්යක්ෂම පොලිස් සේවාවක් රටතුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීමේ අරමුණින් පිහිටුවා තිබූ කමිටුවේ වාර්තාව "පොලිස් ප්‍රතිසංවිධාන ක්‍රියාකාරී සැලැස්ම" ලෙස 2017 මැයි 31 දින එළිදක්වා තිබුණද 2020 ජූනි දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | හඳුනාගෙන ඇති ප්‍රතිසංවිධාන කටයුතු සිදුකළ යුතුය. | ක්‍රියාකාරී කමිටුව අක්‍රීයව පවතින බැවින් නැවත පත්කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඈ) | දඩමුදල් අයකරගැනීම වේගවත් කිරීමත් රජය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහල නැංවීමත් මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථ වාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතියද මේ දක්වා අදාල ක්‍රමය ස්ථාපිතව නොතිබුණි. | හඳුනාගත් අරමුණු ඉටුවන ආකාරයට ස්වයංක්‍රීය දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) පොලිස් උපසේවයේ යහසාධක යෝජනා ක්‍රමය ඇවර කිරීමෙන් අනතුරුව ප්‍රතිලාභ වූ රු. මිලියන 65 ක මුදල 2009 ඔක්තෝබර් 01 දින “පොලිස් වෛද්‍ය සේවා අරමුදල” වශයෙන් ආයෝජනය කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ස්ථාවර තැන්පතු 4 ක ඇතුළු මුළු ශේෂය රු.133,624,248 ක් ව පැවතියද වසර 10 පමණ කාලයක සිට අරමුදලේ සාමාජිකයන්ට හා පවුලේ සාමාජිකයන්ට ප්‍රතිලාභ ගෙවීම අත්හිටුවා තිබුණි. | අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඊ) 2019 අංක 10 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරිම 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදුකරන වාර ගණන පැහැදිලිව හදුනාගත හැකි පරිදි දත්ත පරිගණක ගත කිරීමේ ක්‍රමයක් ශ්‍රී ලංකා පොලිසිය ක්‍රියාත්මක කර නොතිබුණි. එම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදුකරන වරදකරුවන් ගෙන් නිවැරදි දඩ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | රථවාහන නීති කඩකරන වැරදිකරුවන් එම වරද සිදුකරන වාර ගණන හදුනාගත හැකි පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිතකර ඒ අනුව නියමිත දඩ මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. | පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කිරිමට කටයුතු කරමින් පවතී. |
| (උ) පොලිස් CCTV කොට්ඨාශය මගින් පාලනය වන කොළඹ නගරයේ ස්ථාන 33 ක සවිකර ඇති කැමරා 108 ක් 2008 වර්ෂයේ ශ්‍රී ලංකාවට ආනයනය කළ ඒවා විය. මෙම කැමරා පද්ධතිය ANALOG වර්ගයේ වන අතර DIGITAL ක්‍රමයට වෙනස් කිරිම මෙන්ම නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි පරිවර්ථනයක් සිදුකල යුතු අතර එමගින් දත්ත විශ්ලේෂණ හැකියාව, වීඩියෝ දත්තවල පැහැදිලි භාවය, දත්ත සම්ප්‍රේෂණ හැකියාව, දත්ත ගබඩා කිරීමේ ධාරිතාවය වැඩිකර ගැනීමේ හැකියාව, පියවි ඇසින් වීඩියෝ චැනලය වෙත නෙත් යොමා සිටීම වෙනුවට අවශ්‍ය විශේශිත වූ අවස්ථා ස්වයංක්‍රීයව තිර මත පෙන්වා දීමේ හැකියාව වැනි කටයුතු වල | වර්තමානයට ගැලපෙන පරිදි පරිගණක හා කැමරා පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. | කැමරා පද්ධතිය යාවත්කාලීන කිරීමට සැලසුම් කරමින් පවතී. |

| | | |
|---|---|---|
| කාර්යක්ෂමතාවය හා ඵලදායිකත්වය තව තවත් වැඩිදියුණු කර ගත යුතුව තිබුණද එසේ සිදුකර නොතිබුණි. | | |
| (ඌ) පොලිස් ස්ථාන කාර්යාල හා වෙනත් භාවිතයන් සඳහා වූ ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීම් 406 ක කටයුතු 2020 ජූලි 31 දින වන විටත් අවසන් වී නොතිබුණි. මෙම ඉඩම් හා ගොඩනැගිලි ශ්‍රී ලංකා පොලීසිය භුක්ති විඳීම දීර්ඝ කාලයක සිට සිදුවුවද පවරා ගැනීමේ හා අත්පත් කර ගැනීමේ කටයුතු විධිමත් ආකාරයට ආරම්භ කිරීම 2010 වර්ෂයෙන් පසුව සිදුවී තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීම් හා පවරා ගැනීම් කඩිනම් කිරීමට ක්‍රියාකළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) තොරතුරු තාක්ෂණ කොට්ඨාශය විසින් ශ්‍රී ලංකා පොලීසියට හඳුන්වාදී තිබූ පිරිස් පාලන පරිගණක වැඩසටහනට දත්ත ඇතුලත් කිරීම අදියර 05 ක් යටතේ 2017 වර්ෂයේදී ආරම්භකර තිබුණි. ප්‍රාදේශීය පොලිස් කොට්ඨාශ 44 ක, ක්‍රියාකාරී කොට්ඨාශ 65 ක හා විශේෂ කාර්ය බලකාය ඇතුළු සමස්ථ නිලධාරීන් 84,000 කට වැඩි ප්‍රමාණයකගේ තොරතුරු පරිගණක ගත කිරීම මේ මගින් අපේක්ෂා කළද නිලධාරීන් හඳුනාගැනීමේ මූලික අදියරේ තොරතුරු හැර සෙසු අදියරයන් 04 හි දත්ත ඇතුලත් කිරීමේ ප්‍රගතිය (උසස්වීම්, මාරුවීම්, පවුලේ තොරතුරු, අධ්‍යාපන සුදුසුකම්, නිවාඩු, වැටුප් වැනි) සියයට 25 ක මට්ටමේ පැවතුණි. පොලිස් ස්ථාන මට්ටමින් දත්ත ඇතුලත් කිරීම සඳහා දක්වන දායකත්වය ප්‍රමාණවත් නොවීම මීට හේතුවී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | තොරතුරු තාක්ෂණ කොට්ඨාශය විසින් ශ්‍රී ලංකා පොලීසියට හඳුන්වාදී තිබූ පිරිස් පාලන වැඩසටහනට දත්ත ඇතුලත් කිරීම කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා පොලීසියට අනුයුක්තව දැනට සේවයේ නියුතු පොලිස් නිලධාරීන් 87,000 කගේ පමණ හා විශ්‍රාම ගිය නිලධාරීන් 20,000 කගේ පමණ ලිපිගොනු හා අදාල | ගොඩනැගිලි කොට්ඨාශය විසින් ලබාදී තිබෙන වාර්තාව පරිදි රාක්කතුල වූ | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | පොත්පත් මානව සම්පත් කළමණාකරණ කොට්ඨාශයේ සීමිත භූමි ප්‍රමාණයක් තුල රාක්ක මත තබා තිබුණි. මෙම රාක්කද දිරාපත්ව තිබීම මත 2018 නොවැම්බර් මස ගොඩනැගිලි කොට්ඨාශය මගින් ලබාදී තිබූ වාර්තාවකට අනුව මෙම රාක්කවල දරාගත නොහැකි තරම් ලිපි ගොණු ගබඩාකර ඇති බැවින්, හැකි ඉක්මනින් ඉන් අඩක් පමණවත් ඉවත් කලයුතු බව දැනුම් දී තිබුණද, 2020 අගෝස්තු අවසන්වනවිටද එම ලිපිගොනු එසේම ගබඩාකර තිබුණි. මෙම කොට්ඨාශයේ සේවයේ නියුතු 150 ක් ඉක්මවූ නිලධාරීන්ගේ ආරක්ෂාවට මෙන්ම ලිපිගොණුවල ආරක්ෂාවටද මෙම තත්ත්වය බාධාවක් වී තිබුණි. | ලිපිගොනු වලින් අඩක් ඉතා කඩිනමින් ඉවත් කිරිමට කටයුතු කර ලිපිගොනුවල ආරක්ෂාව තහවුරු කල යුතුය. | |
| (ඇ) | යාපනය පොලිස් කොට්ඨාශයට අයත් පොලිස් කාර්යාල, පරිපාලන ගොඩනැගිලි, පොලිස් ස්ථාන, පොලිස් මුරපොළ, නිල නිවාස හා භට නිවාස පවත්වාගන යනු ලබන එකතුව අක්කර 28 ක් පමණ වූ ඉඩම් කැබලි 67 ක් අතුරින් පොලිස් දෙපර්තමේන්තුවේ හිමිකාරිත්වය පැවතියේ ඉඩම් කැබලි 03 කට අයත් එකතුව අක්කර 07 පර්චස් 146 කට පමණි. සෙසු රාජ්‍ය ආයතන සතු අක්කර 08 ක් පමණ වූ ඉඩම් කැබලි 09 ක් හා පෞද්ගලික පාර්ශවයන් සතු එකතුව අක්කර 13 ඉක්මවූ ඉඩම් කැබලි 55 ක් යුධමය වාතාවරණය අවසන්වීමෙන් පසුවත් වසර 10කට වැඩිකාලයක සිට පොලීසියේ කටයුතු සඳහා භාවිත කළද අයිතිය පවරාගනීමේ හෝ මිලදී ගැනීමේ කටයුතු 2020 ජනවාරි මාසය වන විටද අවසන්ව නොතිබුණි. | පොලිසිය සතු නොවුන ද භුක්ති විදින ඉඩම්වල අයිතිය පවරාගැනීම හෝ මිල දී ගැනීම කඩිනමින් සිදු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඈ) | වව්නියාව දිසා අවි ගබඩාවේ 2018 වර්ෂයට අදාලව සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණයේදී T 56 ගිනි අවි 19 ක අතිරික්තයක් හඳුනාගෙන තිබූ අතර පසුව ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ තොරතුරු සමඟ සැසඳීමේදී ගබඩාවේ ඇති T 56 අවි 1,380 න් 1,303ක් පමණක් පොලීසියට අයත් බව හඳුනාගෙන තිබුණි. යුධමය වාතාවරණය පැවති සමයේ ගිනි අවි පිළිබඳව නිරවුල්ව පොත්පත් පවත්වා ගැනීමක් සිදුව නොතිබිම මත ඇති වී ඇති මෙම ගිනි අවි සම්බන්ධ ගැටළු නිරවුල්කර ගැනීම 2020 අගෝස්තු දක්වාම අවසන්ව නොතිබුණි. | මෙම ගිනි අවි සම්බන්ධ ගැටළු නිරවුල් කර ගැනීම කඩිනමින් කළ යුතුය. | නිරීක්ෂණ සම්බන්ධයෙන් එකඟතාව පලකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) සමාලෝචිත වර්ෂය තුළ දී කාන්තාවන්ට සිදුව තිබූ ප්‍රධාන බල අපරාධ වූ බරපතල තුවාල සිදුකිරිම, ස්ත්‍රී දූෂණ හා මිනීමැරීම පිළිබඳ වාර්තා වූ පැමිණිලි පිළිවෙලින් 208ක් 199ක් හා 95 ක් විය. නමුත් විසඳීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 37, 31 හා 45 තරම් අඩු මට්ටමක පැවතුණි. | කාන්තාවන්ට සිදුව තිබූ ප්‍රධාන බල අපරාධ විසඳීමේ ප්‍රතිශතය ඉහළ නන්වා ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඊ) ළමයින්ට සිදුව තිබූ ප්‍රධාන බල අපරාධ වූ ස්ත්‍රී දූෂණය, බරපතල ලිංගික අපයෝජනය හා අපහරනය පිළිබඳව වාර්තා වූ පැමිණිලි පිළිවෙලින් 1,576 ක් 623 ක් හා 606 ක් විය. නමුත් විසඳීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 58 ක් 50 ක් හා 56 ක් තරම් අඩු මට්ටමක පැවතුණි. | ළමයින්ට සිදුව තිබූ ප්‍රධාන බල අපරාධ, ස්ත්‍රී දූෂණය, බරපතල ලිංගික අපචාර, අපයෝජනය හා අපහරනය පිළිබඳව වාර්තා වූ පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය ඉහළ නන්වා ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (උ) සමාලෝචිත වර්ෂය තුළ දී නිද්‍රා ජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තා විම 2018 වසරට සාපේක්ෂව 4,825 කින් ඉහළ ගොස් තිබුණ අතර හෙරොයින් අත්අඩංගුවට ගත් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 1,380 කින් හා හෙරොයින් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් 8,672 කින් වර්ධනය වී තිබුණි. | නිද්‍රා ජනක ද්‍රව්‍ය සංසරනය හා භාවිතය අවම කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

**3.4 ප්‍රසම්පාදනය**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පොලිස් සේවයේ 60,000 ක් පමණ වන පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරීන්ට අවශ්‍ය හිස් වැසුම් (P –Cap) අවසන් වරට මිලදී ගෙන තිබුණේ 2013 පෙබරවාරි මාසයේදීය. ආධුනික නිලධාරීන්ට අවශ්‍ය ප්‍රමාණය සුළු වශයෙන් පසුව මිලදී ගත්තද වාර්ෂික හිස්වැසුම් ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු කර මිලදී නොගැනීම නිසා වසර 03 කට වැඩි කාලයක සිට ඉහත නිලධාරීන්ට හිස්වැසුම් ලැබී නොතිබුණි. | නිලධාරීන්ට අවශ්‍ය හිස්වැසුම් අවශ්‍ය අවස්ථාවේදී ලබාදීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා පොලීසිය සතු යතුරු පැදි ඇතුළු මුළු වාහන සංඛ්‍යාව 10,123 ක් වූ අතර එයින් 1,561 ක් ජීප් රථ විය. මෙම ජීප් රථ සංඛ්‍යාවෙන් 909 ක් හෙවත් සියයට 58 ක් 2004 ට පෙර එනම් වසර 15 කට පෙර මිලදීගත් ඒවා විය. පසුගිය වසර 05 තුල ජීප්රථ 21 ක් පමණක් වාහන සංචිතයට එකතුවී තිබුණි. මෙම තත්වය තුල පොලීසියේ රාජකාරී ඉටුකිරීමට නව ජීප්රථ මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගෙන 2018 අගෝස්තු 08 දින අමප/18/1650/828/10-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජීප් රථ 750 ක් (විශේෂ කාර්ය බලකාය සඳහා ජීප්රථ 150 ක් ඇතුළුව) ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (Indian Line of Credit) යටතේ මිලදී ගැනීමට අනුමැතිය ලැබී තිබුණි. මීට අදාල ප්‍රසම්පාදන කටයුතු 2020 අගෝස්තු මාසය දක්වාත් ප්‍රමාද වෙමින් පැවතීම නිසා පොලිස් ස්ථාන, පොලිස් කොට්ඨාශ හා විශේෂ ඒකකවල රාජකාරී ඉටුකිරීමේදී ප්‍රවාහන ගැටළු ඇතිවී තිබුණි. | අනුමැතිය ලැබී තිබෙන ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ජීප්රථ 750 මිලට ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු කඩිනම් කර ජීප් රථ මිලිට ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | පොලීසියේ පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරින්ට කොළඹ ප්‍රදේශයේ නවැතැන් පහසුකම් සපයා ගැනීම ඇතුළු දුෂ්කරතා අවම කිරීමට එම නිලධාරීන් සඳහා නවාතැන් පහසුකම්, භෝජනාගාරය හා රථගාල පහසුකම් ලබාදීම වෙනුවෙන් කොම්පඤ්ඤවීදියේ මහල් 06 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට යෝජනා වී තිබුණි. ඒ අනුව 2018 මාර්තු 07 දින අංක අමප/180342/748/012 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යටතේ මුළු පිරිවැය රු.468,272,027 කට 2018 – 2020 මධ්‍යකාලීන අයවැය රාමුව තුල ඉදිකිරීමට අනුමැතිය ලැබී තිබුණි. එහෙත් 2020 අගොස්තු මාසය වනවිටත් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු මේ සඳහා තෝරාගෙන නොතිබුණි. | කොන්ත්‍රාත් කරුවකු කඩිනමින් තෝරාගෙන ඉදිකිරීම කඩිනම් කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය නිල ඇඳුම් අයිතම (ලෙදර් සපත්තු -PS/PC, ක්‍රීඩා සපත්තු - PS/PC හා වැහි කබා - Rain Coat – Woman වැනි), උණ්ඩ හා අවි (Ammunition, Pistols) සහ ලී බඩු උපකරණ (පොත් රාක්ක හා කබඩ්) වැනි භාණ්ඩ මිලදී ගැනීම සඳහා 2019 වර්ෂයේදී ආරම්භකර තිබූ ප්‍රසම්පාදන ලිපිගොණු 32 ක ප්‍රසම්පාදන කටයුතු, තාක්ෂණික ඇගයීම් තවදුරටත් සිදුවීම හා පිරිවිතරයන් නැවත සැකසීම වැනි හේතු මත 2020 අගෝස්තු මාසය වන විටත් අවසන්ව නොතිබුණි. | අදාල ගොනු 32 හි ප්‍රසම්පාදන කටයුතු තාක්ෂණික ඇගයීම් හා පිරිවිතරයන් සැකසීම කඩිනමින් සිදුකර මිලදී ගැනීම කඩිනම් කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) පොලිස් නිලධාරීන්ට අවශ්‍ය ක්‍රීඩා මේස් (Sport Socks) 2018 වර්ෂය සඳහා 150,000 ක් රු.18,285,000 කටද 2019 වර්ෂය සඳහා 152,000 ක් රු.19,699,200 කටද මිලදීගෙන තිබූ අතර 2019 සැප්තැම්බර් සිට 2020 මාර්තු දක්වා කාලය තුල මෙම ක්‍රීඩා මේස් 302,000 ක ප්‍රමාණය පොලිස්පති ගබඩාව වෙත ලැබී තිබුණි. 2020 අගෝස්තු මාසය වනවිට ක්‍රීඩා මේස් නිලධාරීන් වෙත සපයමින් තිබුණි. ක්‍රීඩා සපත්තු 60,000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2019 මැයි මාසයේ ආරම්භ කර තාක්ෂණ ඇගයීම් කටයුතු 2020 සැප්තැම්බර් මස වන විටත් සිදුකරමින් පැවතුණි. මේ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් නිසා නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් නිසි අවස්ථාවේ ලැබීමේ ප්‍රමාදයන් පැවති බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කර නිලධාරීන්ට අවශ්‍ය පහසුකම් නිසි අවස්ථාවේදී ලබාදීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

3.5 **අනාර්ථික ගණුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) 2008 මාර්තු 19 දින උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා වැඩ ආරම්භකර 2018 වර්ෂය අවසාන වන විට රු.8,895,273 ක් වැයකර තිබුණද ඉදිකිරීම් අතරමග නැවතී තිබුණි. 2008 වර්ෂයේ පොලීසියට පවරා දී තිබූ අක්කර 06 ක මෙම භූමියද නිරවුල්කර ගැනීමෙන් තොරව පැවතුණි. | රු.8,895,273 ක් වැයකර ඉදිකිරීම් ආරම්භකර අතරමග නතර කර දමා තිබෙන උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. පවරා දී තිබෙන අක්කර 6 ක භූමියද කඩිනමින් නිරවුල් කර ගත යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා පොලීසිය සඳහා අවශ්‍ය ගොඩනැගිලි 271 ක් කුලී පදනම මත ලබා ගැනීම සඳහා 2019 වර්ෂය වෙනුවෙන් වාර්ෂික කුලිය ලෙස රු.260,675,352 ක් ගෙවා තිබුණි. ඒ අතරින් කොළඹ නගරයේ පිහිටි වර්ග අඩි 162,088 ක් වූ ගොඩනැගිලි 15 ක් සඳහා වාර්ෂික කුලිය රු. මිලියන 148.28 ක් වූ අතර එම සියලු ගොඩනැගිලි වර්ෂ 03 සිට 08 දක්වා කාලයක සිට කුලියට ගත් ගොඩනැගිලි විය. මෙම කුලී | පොලීසිය සඳහා ගොඩනැගිලි අවශ්‍යතාවය විධිමත්ව හඳුනාගෙන සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි වෙනුවට ගොඩනැගිලි ඉදිකිරීමට අදාල දීර්ඝ කාලීන සැලැස්මක් ශ්‍රී ලංකා පොලීසිය සතුව නොතිබුණි. | | |
| (ඇ) | පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරීන් සඳහා හිස්වැසුම් 75,000 ක් මිලදී ගැනීමට 2011 වර්ෂයේ ආරම්භ කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදුව තිබූ අවිධිමත් කරුණු නිසා බේරුම්කරණයේදී ලබා දී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ශ්‍රී ලංකා පොලීසිය විසින් ප්‍රතික්ෂේප කරමින් අඛණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී තිබුණි. 2020 ජූනි මාසය වන විටත් අධිකරණ කටයුතු අවසන්ව නොතිබුණු අතර සැපයුම් කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසියද ශ්‍රී ලංකා පොලීසිය දැරිය යුතුබවට සැපයුම්කරු ඉල්ලා තිබුණි. | සැපයුම්කරුට ගෙවීමට සිදුවිය හැකි ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වෙනස්වීම මත සිදුවිය හැකි අවාසි අවම වන පරිදි කටයුතුකර අධිකරණ කටයුතු කඩිනමින් අවසන්කර ගැනීමට කටයුතු කළ යුතුය. | ලබා දී ඇති පිරිවිතරයට අනුව හිස් වැසුම් ලබා ගැනීමෙන් පසු පැමිණිලි පාර්ශවයට ගෙවීමට ඇති පොලී ප්‍රතිශතය සම්බන්ධව මහ බැංකුව විසින් අනුමතකර ඇති මිනුම් ඒකකවලට අනුව අදාල ගෙවීම් කටයුතු කිරීමට එකඟතාවයකට පත්වීමට නොහැකි වුවහොත්, ගරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ප්‍රතිශෝධන අයදුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා වී ඇත. |
| (ඇ) | හබරාදුව “නිල සෙවණ” නිවාස යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. 3,800,000 බැගින් රු.729,600,000 කට නිවාස 192 ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2009 අප්‍රේල් 02 දින වන විට අවස්ථා 05 කදී රු. මිලියන 500 ක් ගෙවා තිබුණද එක් නිවසක් රු. 1,548,000 ක් පමණක් වියයුතු බවට කරුණු ඉදිරිපත්ව තිබුණි. ඒ අනුව නිවාස 192 හි මුළු වටිනාකම රු.304,128,000 ක් පමණක් විය. තවද “නිල සෙවණ” යෝජනා ක්‍රමයේ නවීකරණය සම්බන්ධයෙන් වූ කොන්දේසි යටතේ නිවාස 115 ක් පමණක් රජයේ සේවකයන්ට අලෙවිකල හැකිව තිබුණද නිවාස 192 ක් මිලදී ගැනීමට ගිවිසුම්ගතව තිබුණි. | “නිල සෙවණ” යෝජනා ක්‍රමයේ කොන්දේසි ප්‍රකාර මිලදී ගැනීම සිදුකළ යුතු අතර, වටිනාකම ඉක්මවා සිදුකර ඇති ගෙවීම් සඳහා විධිමත් පියවර ගත යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඉ) | 2016 දෙසැම්බර් මස රු.333,000,000 කට මිලදීගෙන තිබූ වැකුණගොඩ “නිල සෙවණ” නිවාස ව්‍යාපෘතියේ නිවාස 100 ට අදාල පැවරුම් ඔප්පු 2020 අගෝස්තු මාසය වන විටත් ලබාගෙන නොතිබුණි. | නිවස සඳහා ඔප්පුව ලබා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. | කෙටුම්පත් කරන ලද ඔප්පු පිටපත් නීති කොට්ඨාශය වෙත ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. |

## 3.6 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සපුගස්කන්ද පොලිස් ස්ථානය පිහිටි අක්කර 4 ක ඉඩමෙන් අක්කර දෙකක පමණ භූමියක් 1981 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි. තවද, නාරාහේන්පිට පොලිස් රෝහල පුළුල් කිරීම සඳහා 2018 වර්ෂය අවසාන වන විට රු. මිලියන 334 ක් වැය කර ඉදිකරන මහල් 6 කින් සමන්විත ගොඩනැගිල්ලේ මහල් 4 ක් 2020 ජූනි මාසය වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. | දක්වා තිබෙන ඌණ උපයෝජන වත්කම් උපයෝජනය කඩිනම් කළ යුතුය. | කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවීම මීට හේතු ලෙස දක්වා මේවන විට අලුතින් වෛද්‍ය නිලධාරීන් 14 දෙනෙකු ද්විතීයික පදනමින් බඳවා ගැනීමේ කටයුතු අවසන් කර ඇති බවත් හෙද නිලධාරීන් ලෙස 29 දෙනෙකු බඳවාගෙන පුහුණුවට යවා ඇති බවත් හෙද පුරප්පාඩු සඳහා විශ්‍රාමික පුහුණු නිලධාරීන් ත්‍රිවිධ හමුදාවෙන් හා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් මෙම බඳවා ගැනීම් වලින් අනතුරුව ගොඩනැගිල්ල පූර්ණ ලෙස භාවිතා කල හැකි බව. |
| (ආ) පොලිස් නිලධාරීන්ගේ භාවිතයට ගත නොහැකි ලෙස හානියට පත්ව හා කල් ඉකුත් වී දීර්ඝ කාලයක සිට කොටහේන පොලිස්පති ගබඩාවේ පවතින නිල ඇඳුම් හා පදක්කම් ඇතුළු අයිතම 63 කට අයත් ඒකක 77,450 ක් පිළිබඳව 2017 වර්ෂයේ විගණනය විසින් හා 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වාදී තිබුණද මේ දක්වා ඊට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාවිතයට ගත නොහැකි ලෙස හානියට පත්ව හා කල් ඉකුත් වී ඇති නිල ඇඳුම් හා පදක්කම් ඇතුළු අයිතම 63 ට අයත් ඒකක 77,450 සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් සිදුකළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) පොලිස් අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරීමට මල්වාන පිහිටි අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක් වූ ඉඩම ශ්‍රී ලංකා පොලීසියට පවරා දීම සඳහා 2017 ජූනි මස 20 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද 2020 ජූලි මස වන විටත් එම ඉඩම් පැවරීමේ කටයුතු මන්දගාමීව සිදුවෙමින් පැවතුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබෙන මෙම ඉඩමෙහි පවරාගැනීම පිළිබඳ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඈ) පොලිස් අශ්වාරෝහක කොට්ඨාශය හා රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2017 සැප්තැම්බර් 28 දින භුක්තිය භාරදී තිබූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩමේ අක්කර 75 ක භූමිය අදාල අරමුණ සඳහා යොදාගැනීමට කටයුතු කර නොතිබුණි. ඉඩම වටා වැටක් ඉදිකිරීමට යෝජනාවී තිබුණද එය ද ක්‍රියාත්මක වී නොතිබුණි. | ඇල්ලේකන්ද වත්ත අක්කර 75 ක භූමිය අදාල අරමුණු සඳහා යොදවා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

4. **යහ පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණක තනතුර ඇතුලුව විගණන කාර්ය මණ්ඩලයේ තනතුරු 60 න් 28 ක් පුරප්පාඩුව පැවතුණ ද එම පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම ඒකකයේ ඉහළ කාර්ය සාධනය ලඟා කර ගැනීමට බාධාවක් වී තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. | නවක නිලධාරීන් යෙදවීම ඵලදායි නොවන බවත් පළපුරුදු නිලධාරීන් අනුයුක්ත කිරීමේදී ඒ වෙනුවට අනුප්‍රාප්තික නිලධාරීන් ලබා දීමට හැකියාවක් නොමැතිවීම නිසා වෙනත් පළපුරුදු නිලධාරීන් නිදහස්කර ගැනීමේ දුෂ්කරතා පවතින බැවින් පළදායි අයුරු විගණන නිලධාරීන් ලෙස නිලධාරීන් අනුයුක්ත කිරීමට නොහැකි වී ඇත. |

5. **මානව සම්පත් කළමනාකරණය කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) නිල ඇඳුම් කාර්ය මණ්ඩලය යටතේ 2019 දෙසැම්බර් 31 දිනට පැවති මුළු පුරප්පාඩු සංඛ්‍යාව 10,092 ක් වුවද 2020 වර්ෂයේ බඳවාගැනීම් වලින් පසුව 2020 ජුලි 31 දින වන විට ද මුළු පුරප්පාඩු සංඛ්‍යාව 7,217 ක් පැවතුණි. එදිනට සේවය අතහැර ගිය (VOP) නිලධාරීන් 3,514 ක් හා වැඩ තහනම් කල නිලධාරින් 895 ක් සිටීම මත අනුමත කාර්ය මණ්ඩලය 85,603 කින් නිලධාරීන් 11,626 ක් පුරප්පාඩුව පැවතීම ශ්‍රී ලංකා පොලීසියේ දෛනික රාජකාරී ඉටු කිරීමේදී බාධාවක් වී තිබුණි. | ශ්‍රී ලංකා පොලීසියේ දෛනික රාජකාරී ඉටු කිරීමේදී බාධාවක්ව පවතින නිලධාරී ඌණතාවය මගහැරවා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා පොලීසියේ සිවිල් කාර්ය මණ්ඩලයට අයත් සහකාර අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන) තනතුර, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර, ගණකාධිකාරී තනතුරු 56 න් 24 ක් හා පරිපාලන නිලධාරී තනතුරු 11 න් 9 ක් පුරප්පාඩුව පැවතීම, පොලීසියේ මූල්‍ය හා පරිපාලන කාර්යයන් ඉටුකිරීමේදී බාධාවක් වී තිබුණි. | පුරප්පාඩු වූ තනතුරු පුරවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟවී ඇත. ඒ අනුව දක්වා ඇති පුරප්පාඩු සපුරාගැනීමට මේ වන විට ගත්පියවරයන් ලිඛිතව දක්වා තිබුණි. |
| (ඇ) නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ ප්‍රධාන පොලිස් පරික්ෂක, පොලිස් පරික්ෂක, උපපොලිස් පරික්ෂක, පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් යන තනතුරු 05 සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි අනුමත | නිල ඇඳුම් කාර්ය මණ්ඩලය හා සහායක සේවයේ අවශ්‍යතාවය සපුරා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ වී පුරප්පාඩු සපුරා ගැනීම සම්බන්ධයෙන් ඒ ඒ තනතුරට අදාලව ගත් ක්‍රියා මාර්ග ලිඛිතව දක්වා තිබුණි. |

| | | |
|---|---|---|
| කරවාගෙන නොතිබූ අතර සහායක සේවයේ අනුමත තනතුරු 106 ක් පැවතියද තනතුරු76 ක් සඳහා බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි අනුමත කරවාගෙන නොතිබුණි. | | |
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට සහායක සේවයේ අනුමත කාර්ය මණ්ඩලය 7,615 ක් වුවද පුරප්පාඩු 6,361 ක් හෙවත් සියයට 83 ක් පැවතීම, වෛද්‍ය කොට්ඨාශයේ හා ගොඩනැගිලි කොට්ඨාශයේ කටයුතුවලට මෙන්ම ශ්‍රී ලංකා පොලීසියේ තොරතුරු තාක්ෂණ හා ගොඩනැගිලි නඩත්තු කටයුතු ද උපරිම කාර්යක්ෂම ලෙස පවත්වාගන යාමට බාධාවක් වී තිබුණි. | සහායක සේවයේ අනුමත කාර්ය මණ්ඩලයේ ඇති පුරප්පාඩු පුරවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සකස් කර ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමුකර ඇත. අනුමැතිය ලද පසු බඳවා ගැනීමට හැකි බව. |
| (ඉ) 2020 ජුලි 31 දිනෙන් පසුව හා 2025 දෙසැම්බර් 31 දිනත් අතර කාලපරිච්ඡේදය තුල නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 9,916 ක් හා සහායක සේවයේ නිලධාරීන් 270 ක් විශ්‍රාම ගැනීමට නියමිතව සිටින අතර මෙම පුරප්පාඩු හා දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට වාර්ෂික සැලසුම් (ඉලක්කගත දින ඇතුලත්) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පිළියෙලකර නොතිබුණි. | දක්වා ඇති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට වාර්ෂික සැලසුම් ඉලක්කගත දින ඇතුලත්ව කඩිනමින් පිළියෙල කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඊ) පොලිස් ස්ථාන, කොට්ඨාශ හා කාර්යාල මට්ටමින් සිටිය යුතු එක් එක් නිලයට අදාල නිලධාරීන් සංඛ්‍යාව හඳුනාගැනීම සඳහා බස්නාහිර පළාතේ මූලික ඇගයීම සිදුකර නොතිබූ අතර සෙසු පළාත් 08 සම්බන්ධයෙන් මූලික ඇගයීම් පමණක් සිදුකර තිබුණි. මෙම තත්ත්වය මත එක් එක් ස්ථානයන්හි සිටින නිලධාරීන්ගේ ඌනතාවයක් හෝ අතිරික්තයක් හඳුනාගත නොහැකි විය. | අදාල කාර්යාලවල මූලික ඇගයීම් සිදුකර කාර්යාල මට්ටමින් සිටිය යුතු නිලධාරීන් හඳුනාගැනීමට අදාල කටයුතු කඩිනම් කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |
| (උ) 2015 – 2019 කාල පරිච්ඡේදය තුල යාපනය මූලස්ථාන පොලීසියේ නිලධාරීන් සංඛ්‍යාව 703 සිට 483 දක්වා ද, වව්නියාව මූලස්ථාන පොලීසියේ නිලධාරින් සංඛ්‍යාව 464 සිට 384 දක්වාද යාපනය කොට්ඨාශයේ නිලධාරින් සංඛ්‍යාව 1223 සිට 1081 දක්වා ද අඩුවී තිබුණි. උතුරු පළාතට වාර්ෂික ස්ථානමාරුවීම් ලබන නිලධාරින් වෙනත් ප්‍රදේශවලට ස්ථාන මාරුවීම් ලබා ගැනීම මෙයට හේතු වී තිබූ අතර මෙම තත්ත්වය උතුරු පළාතේ පොලිස් ස්ථානවල දෛනික රාජකාරී පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. | උතුරු පළාතේ පොලිස් ස්ථානවල දෛනික රාජකාරි පවත්වාගෙන යාමට බාධාවක් නොවන පරිදි නිලධාරීන් යෙදවීමට කටයුතු කළ යුතුය. | කොට්ඨාශයේ හට සංඛ්‍යාව අඩුවීමට සාපේක්ෂව යාපනය මූලස්ථාන පොලිස් ස්ථානයට අනුයුක්ත නිලධාරීන්ද සාපේක්ෂව අඩුකිරීමට සිදුවී ඇත. විටින් විට සිදුකරන නව බඳවා ගැනීම් වලින් මේ සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමට කටයුතු කරමි. |